මගේ යොමුව / எனது இல. / My Ref.: ED/09/12/02/01/07
ඔබේ යොමුව / உமது இல. / Your Ref.:
දිනය / திகதி / Date: 2026.03. 12

PMG/PA/ 1746/26

214
2 3 MAR 2026
UPU B

20 MAR 2026

තැපැල්පති,
තැපැල් දෙපාර්තමේන්තුව,
ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

**55 වන ජාත්‍යන්තර ලිපි ලිවීමේ තරගාවලිය (2026)**

උක්ත කරුණට අදාළව ඔබ විසින් යොමු කරන ලද අංක POST/HQ/OP/IPS/UPU B/01/2026 හා 2026.02.05 දිනැති ලිපිය සම්බන්ධවයි..

එමඟින්, ඔබ දෙපාර්තමේන්තුව මගින් " ඩිජිටල් ලෝකයක මානව සම්බන්ධතාවය වැදගත් වන්නේ මන්දැයි" යන තේමාව යටතේ දිවයිනේ පාසල්වල අවුරුදු 9-15 අතර සිසුන් සඳහා "ජාත්‍යන්තර ලිපි ලිවීමේ තරඟයක් පැවැත්වීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව, අධ්‍යාපන අධ්‍යක්ෂ (ඉංග්‍රීසි හා විදේශ භාෂා) නිර්දේශවලට අනුකූලව පහත සඳහන් කොන්දේසිවලට යටත් ව උක්ත වැඩසටහන සඳහා දිවයිනේ පාසල්වල අවුරුදු 9-15 අතර සිසුන් සහභාගි කර ගැනීමට අනුමැතිය ලබා දෙන බව කාරුණික ව දන්වමි.

1. පාසල්වල විදුහල්පති එකඟතාව ලබා ගත යුතුය.
2. පළාත් පාසල් සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අවසරය ලබා ගත යුතුය.
3. වැඩසටහන සඳහා සහභාගී වන නිලධාරීන් ,දේශකයින් ,සම්පත්දායකයින් විනය විරෝධී විෂමාචාර ක්‍රියාවන්ට සම්බන්ධ නොමැති හා සුදුසුකම් සහිත පුද්ගලයින් විය යුතු ය.
4. මේ සඳහා සහභාගී වන සිසුන්ගේ ආරක්ෂාව ,සෞඛ්‍ය ,විනය හා පහසුකම් සම්බන්ධ සියලුම වගකීම ඔබ විසින් දැරිය යුතු ය.
5. සහභාගී වීම සඳහා සිසුන්ට කිසිදු ආකාරයක බලපෑමක් සිදු නොකළ යුතුය.
6. දෙමාපිය අවසරය මත ගුරුවරුන්ගේ අධීක්ෂණය යටතේ පමණක් සිසුන් සහභාගි කරවා ගත යුතුය.
7. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධා නොවිය යුතුය.
8. සහභාගී වන සිසුන්ගේ චරිතයට, අභිමානයට, පෞද්ගලිකත්වයට හා ගෞරවයට හානි නොවන ආකාරයට කටයුතු සිදු කළ යුතු ය.
9. සිසුන්ගෙන් හෝ දෙමාපියන්ගෙන් කිසිදු මුදලක් හෝ ප්‍රතිලාභයක් හෝ ලබා නොගත යුතුය.
10. මෙම වැඩසටහන තුළින් ආයතනය සඳහා ඍජුව හෝ වක්‍රව අරමුදල් රැස්කිරීමක් සිදු නොකළ යුතුය.
11. සිසුන්ගේ පෞද්ගලික තොරතුරු ලබා ගනිමින් වැඩසටහනෙන් පසු ඔවුන් හා සම්බන්ධව නොවිය යුතුය.
12. පාසල් සිසුන්ට උචිත මාතෘකා යටතේ තරඟ පැවැත්විය යුතුය. පාසල් සිසුන්ගේ ඒ ඒ වයස් කාණ්ඩයට ගැලපෙන ආකාරයෙන් නිදර්ශක ,වචන භාවිතය ,වීඩියෝ පට පෙන්වීම ආදිය සිදු කිරීමට කටයුතු කළ යුතුය.
13. තරඟාවලිය ප්‍රමිතිගත නීතිරීතීන් හා ආචාර ධර්ම පිළිපදිමින් තේමානුකූලව සම්මත කරගත් මාර්ගෝපදේශ අනුව පැවැත්විය යුතුය.
14. පවත්වන තරගවල විනිශ්චය සම්බන්ධව විනිවිදභාවය සහ අපක්ෂපාතීබව පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

15. සිසු නිර්මාණවල අනන්‍යතාවය තහවුරු කළ යුතුය.
16. ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ආකාරයේ කිසිදු කටයුත්තක් සිදු නොකළ යුතුය.
17. ළමා මනසට නොගැලපෙන ආකල්ප වර්ධනය වන ආකාරයේ කිසිදු කටයුත්තක සිසුන් නොයෙදවිය යුතුය.

තවද, මෙහි දී අවස්ථානුකූලව පැන නගින ඕනෑම සුවිශේෂී ගැටලුවක දී හදිසි කෙටි දැනුම්දීමකින් වැඩසටහන සඳහා ලබා දෙන ලද අවසරය අවලංගු කිරීමේ බලය ලේකම් සතු වන බව ද වැඩිදුරටත් දන්වමි.

D. A. N. Perera

ඩබ්.ඒ. නීලිකා පෙරේරා
අධ්‍යාපන අධ්‍යක්ෂ
(පාසල් කටයුතු)

අත්. කළේ/ පී. ආර්. කාරියවසම්
අතිරේක ලේකම් (පාසල් කටයුතු)
ලේකම් වෙනුවට

පිටපත් :

1. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (තැපැල්) , සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
2. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, ............ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
3. අධ්‍යාපන අධ්‍යක්ෂ, ජාතික පාසල්
4. අධ්‍යාපන අධ්‍යක්ෂ, ඉංග්‍රීසි හා විදේශ භාෂා

කරු.දැ.ගැ.ස.